## H. A . Indrani Allis –Medirigiriya

## <u>(Thakshila Stores )</u>



### Background

Client Name : H. A . Indrani Allis

Residential Address : 323/2 Kusumpokuna,
Diulankadawala

Type of Business : Retails business & Tea
Shop

Market Area : Kusumpokuna

### The Story of my business

Indrani started here business in part of her small house. Since 2014, she expanded here business with little savings from her husband earnings. She also added small tea shop to her business. She wanted additional investment for further development. There are several microfinance providers in her area and she selected CBML because of the attractive monthly repayment process. She expressed that weekly repayment practice not match with her income pattern.

With the CBLM startup loan, she bought equipment for her tea shop and materials for her grocery shop. She paid loan on time and classified as "A" grade client by CBLMF. She is hoping to get another bigger loan for the expansion of her business.

<u>තක්ෂිලා වෙළඳසැල</u>



නම එච්. ඒ. ඉන්ද්‍රානි අල්ලිස්

ලිපිනය 323/2, කුසුම්පොකුණ, දිවුලන්කඩවල

ව්‍යාපාරය සිල්ලර වෙළඳසැලක් සහ
තේ අලෙවිසැලක් පවත්වාගෙන යාම

ව්‍යාපාරික ප්‍රදේශය කුසුම්පොකුණ

2014 අප්‍රේල් මස 04 වන දින නිවසේ කුඩා කඩකාමරයක ඉන්ද්‍රානි මහත්මිය විසින් සුළු පරිමාණයේ තේ අලෙවිසැලක් ව්‍යාපාරයක් වශයෙන් මුල්වරට ආරම්භ කරනු ලැබීය. වඩු

කාර්මිකයකු ලෙස ඇයගේ ස්වාමිපුරුෂයා විසින් උපයා ගෙන ඉතිරි කර තිබූ සුළු මුදල මුල් අවස්ථාවේදී ඒ සඳහා ආයෝජනය කිරීමට ඇයට සිදුවිය. ඇයගේ ව්‍යාපාරික ප්‍රදේශය තුල තේ අලෙවිසැල් පැවතියේ ඉතා සුළු ප්‍රමාණයක් නිසා එකී අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ඇයගේ ව්‍යාපාරය ක්‍රමිකව දියුණු කර ගැනීමට හැකියාව ලැබුණු අතර ඊට සමගාමීව සිල්ලර වෙළඳසැලක් ආරම්භ කර පවත්වාගෙන යාම කෙරෙහි ද ඇයගේ සිත නැඹුරු විය.

එහෙත් එකී අදහස ඉටුකර ගැනීමේදී මූල්‍යමය බාධාවන් රැසකට මුහුණ පෑමට ඇයට සිදුවිය. ප්‍රදේශය පුරා ව්‍යාප්ත වූ මූල්‍ය ආයතන ගණනාවක් පැවතියද ඒවායේ ණය ලබාදීම සිදුවූයේ සතිපතා ණය වාරික ආපසු ගෙවීමේ පදනම මතය. ඇයවිසින් සිදුකරගෙන යන ව්‍යාපාරයේ ස්වභාවය අනුව එලෙස සති වාරික ගෙවීම අපහසු කාර්යයක් විය.

මේ අතර 2014 ජූනි මාසයේදී ඇය සී බී ලංකා මයික්‍රෝෆයිනෑන්ස් ආයතනය වෙත පැමින ඇයගේ අවශ්‍යතාවයට ඉතා හොඳින් ගැලපුනු ආයතනයේ පැවති මාසිකව වාරික ගෙවීමේ පදනම මත ලබා දෙන ණය තෝරා ගෙන 2014.06.30 දින ප්‍රථම ණය මුදල වශයෙන් රුපියල් 20,000/= ක මුදලක් ලබාගන්නා ලදී. එම ණය මුදලින් තේ අලෙවි සැලට අවශ්‍යව තිබූ උපකරණ කිහිපයක් මිලදී ගැනීමටත් අලුතින් ආරම්භ කිරීමට අදහස් කරගෙන සිටි සිල්ලර වෙළඳසැල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සුළු වශයෙන් මිලදී ගැනීමටත් ඇය එම මුදල යොදවන ලදී.



නිසි ලෙස ණය වාරික ගෙවීම නිසාත් ක්‍රම ක්‍රමයෙන් ඇයගේ සුළු ව්‍යාපාරය දියුණු වීම නිසාත් “A” ශ්‍රේණියේ ගනුදෙනු කාරියක් ලෙස සුදුසුකම්ලබා රුපියල් 40,000/= ක මුදලක් 2014-08-06 දින ආයතනයෙන් නැවත ලබාගැනීමට ඇය සමත් විය. එකී මුදලින් සිල්ලර වෙළඳසැලෙහි අලෙවි කිරීම සඳහා අවශ්‍ය වෙළඳ ද්‍රව්‍ය වැඩිපුර ප්‍රමාණයක් මිලදී ගැනීමට මෙන්ම ඉලෙක්ට්‍රොනික තරාදියක් මිලට ගැනීමට ඇයට හැකිවිය.

මෙම ව්‍යාපාරය මගින් ඇයගේ පවුලේ ආර්ථික තත්වය සවිමත් කර ගැනීමට ඇයට හැකියාව ලැබී ඇති අතර සී බී ලංකා මයික්‍රෝෆයිනෑන්ස් ආයතනය ඇය වෙත ලබා දුන් සහයෝගය ඇයගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා විශාල පිටිවහලක් වූ බව ඇය ස්තූති පූර්වකව සිහිපත් කරයි.